සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	නර්තනය (දේශීය) - I	කාලය நேரம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

විශේෂ උපදෙස්:

- සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව II උඩරට නර්තනය හෝ III **පහතරට** නර්තනය හෝ IV **සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- II, III හා IV වන කොටස්වලින් කවලමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසකට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

සැලකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

1. සාම්ප්‍රදායිකව වන්නම් නැටීමේ දී ..... වලන ඇසුරුකරයි.
   (1) රිද්මයානුකූල (2) ප්‍රකාශණාත්මක (3) තාලානුකූල (4) ස්ථිතික

2. දෙවියන්ට, බුදුන්ට හා රජුන්ට පවන් සැලීමේ ක්‍රියාවලිය ඇසුරෙන් ..... නැටුම නිර්මාණය වී ඇත.
   (1) චාමර (2) සවරන් (3) පතුරු (4) රබන්

3. මාත්‍රා 2+4 තාල රූපය ..... යනුවෙන් හඳුන්වයි.
   (1) සුළු මැදුම් දෙනිත (2) සුළු මහ දෙනිත (3) මැදුම් මහ දෙනිත (4) දෙසළු මහ තුන් නිත

4. ..... යනු අවකාශ භාවිතයේ දී හමුවන මූලධර්ම දෙකකි.
   (1) ආලෝකය හා පසුතල (2) රටා හා රිද්මය (3) තල හා දිසා (4) තාලය හා රිද්මය

5. මුරුගන් දෙවියන්ට පූජෝපහාර පිණිස ..... නැටුම නටනු ලැබේ.
   (1) කෝලාට්ටම් (2) කාවඩි (3) පින්නල් කෝලාට්ටම් (4) සුලකු

Past Papers Wiki

6. කරුණා රසය ජනිත වන්නේ ..... භාවය මඟිනි.
(1) හාස (2) ශම (3) ශෝක (4) රති

7. 1934 දී රබින්ද්‍රනාත් තාගෝර්තුමා නිර්මාණය කළ ..... මුද්‍රානාට්‍යය රීගල් නෘත්‍ය ශාලාවේ රංගගත කෙරිණි.
(1) සීතාහරණ (2) ශාප්මෝචන් (3) සිරිහබෝ (4) සැළලිහිණි

8. කථකලි නෘත්‍ය නාටකයන් රැවුල් භාවිත අංගරචනය ..... නම් වේ.
(1) තාඩි (2) මීතික්කු (3) ඩෙප්පු (4) කන්ති

9. නර්තන ..... කාර්යයේ දී සමේ වර්ණය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
(1) රංග රචනය (2) අංග රචනය (3) තිර රචනය (4) රූප රචනය

10. පොළොන්නරු යුගයේ ඉදි කළ සරස්වතී මණ්ඩපය ..... රජුගේ නිර්මාණයකි.
(1) දෙවන පරාක්‍රමබාහු (2) පළමුවන පරාක්‍රමබාහු
(3) දෙවන රාජසිංහ (4) කීර්ති ශ්‍රී රාජසිංහ

11. නර්තනයේ භාවිත ත්‍රිවිධ ලය ගුනවත ආකාරය දැක්වෙන වරණය තෝරන්න.
(1) සමගුණ, දෙගුණ, සිවුගුණ (2) සමගුණ, දෙගුණ, තුන්ගුණ
(3) සිව්ගුණ, දෙගුණ, තුන්ගුණ (4) දෙගුණ, තුන්ගුණ, සිව්ගුණ

12. **"මහනුවර පෙරහරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්"** යනුවෙන් දළදා පෙරහැර පිළිබඳ තොරතුරු දැක්වූයේ,
(1) ස්පිල් බර්ජන් ය. (2) ඉබන් බතූතා ය. (3) රොබට් නොක්ස් ය.(4) ජෝන් ඩේව් ය.

13. පිළිවෙලින් සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාළි වන්නේ,
(1) ගුරුගේ මාලාව සහ අසුර යක්කම ය. (2) අඹවිදමන සහ අසුර යක්කම ය.
(3) වැදි යක්කම සහ ගුරුගේ යක්කම ය. (4) අසුර යක්කම සහ ගුරුගේ මාලාව ය.

14. **"තුන්මස් තුන් පෝයක් ගත වන්නේ"** මෙය සොකරි නාටකයේ ගායනය කෙරෙන අවස්ථාව නම්,
(1) ගුරුහාමි පැමිණීමේ දී (2) සොකරිය පැමිණීමේ දී
(3) සත් මුහුදු තරණයේ දී (4) සොකරිය දරුවා නැළවීමේ දී

15. අතීතයේ යුධමය අවස්ථාවන් හි සන්නිවේදනයෙහි ලා වාදනය කරන ලද්දේ,
(1) මළ බෙරය (2) රණ බෙරය (4) මඟුල් බෙරය (4) වද බෙරය

16. ලක්නව්, ජයිපූර් ගුරුකුල වඩාත් ප්‍රචලිත වූයේ,
(1) කථක් නර්තනයට ය. (2) මනිපුරි නර්තනයට ය.
(3) කථකලි නර්තනයට ය. (4) භරත නාට්‍යම් නර්තනයට ය.

17. ප්‍රාදේශිකව පවත්නා වෘත්තීන් තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති ගැමි නැටුම් වනුයේ,
(1) ලී කෙළි සහ ගොයම් (2) ගොයම් සහ රබන් ය.
(3) රබන් සහ කුලු ය. (4) කුලු සහ ගොයම් ය.

18. සාම්ප්‍රදායික රංග අභරණයක් නිර්මාණයේ දී වඩාත් අවධානයට ලක් විය යුත්තේ,
(1) නිර්මාණාත්මක බව හා විචිත්‍ර බව පිළිබඳ ය.
(2) රංග වස්ත්‍ර හා අංගරචනය පිළිබඳව ය.
(3) වර්ණ, රේඛා හා හැඩතල පිළිබඳව ය.
(4) ආලෝකය හා පසුතල පිළිබඳව ය.


19. ශාන්තිකර්ම ආශ්‍රිත පූජාත්මක වාදන අවස්ථාවක් නොවන්නේ මින්,
(1) පිං බෙර වාදනය යි.
(2) මඟුල් බෙර වාදනය යි.
(3) හැන්දෑ ධූරය වාදනය යි.
(4) අත්‍යාබෙර වාදනය යි.

20. කොහොඹාකංකාරිය ශාන්ති කර්මයේ දක්නට ලැබෙන සැරසිලි වනුයේ,
(1) යහන, අයිලය හා යක්ගෙය
(2) යහන, අයිලය හා තොරණ
(3) යහන, අයිලය හා කාලපන්දම් ගස
(4) යහන, අයිලය හා බිසෝ කප

- 21 සිට 24 දක්වා ප්‍රශ්නවලට රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.


A


B


C


D

21. A හා C පින්තූරවලින් දැක්වෙන කලාකරුවන් නම්,
(1) පණිහාරත සහ රොබට් නොක්ස් ය.
(2) රොබට් නොක්ස් සහ උදයශංකර් ය.
(3) පණිහාරත සහ චිත්‍රසේන ඩයස් මහතා ය.
(4) පණිහාරත සහ රවීන්ද්‍රනාන් තාගෝර්තුමා ය.

22. B අක්ෂරයෙන් දැක්වෙනුයේ,
(1) මිරැන්ඩා හේමලතා මහත්මිය යි.
(2) වජිරා චිත්‍රසේන මහත්මිය යි.
(3) අංජලිකා චිත්‍රසේන මහත්මිය යි.
(4) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය යි.

23. මෙම කලාකරුවන් අතරින් පාසල් නර්තන අධ්‍යාපනය සංවර්ධනයට දායක වූ කලාකරුවා දැක්වෙනුයේ,
(1) A අක්ෂරයෙනි.
(2) C අක්ෂරයෙනි.
(3) B අක්ෂරයෙනි.
(4) D අක්ෂරයෙනි.

24. රන් කිකිළි, තන්හා ආශා හා සත්පත්තිනි මුද්‍රා නාට්‍ය නිර්මාණ කළ කලාකරුවන් අනුපිළිවෙළින් දැක්වෙනුයේ,
(1) D, B හා A රූප මගිනි.
(2) A, B හා C රූප මගිනි.
(3) D, C හා A රූප මගිනි.
(4) B, A හා C රූප මගිනි.

- ප්‍රශ්න අංක 25 සිට 27 දක්වා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.


	1	2	3
A	මෙලෙයි යකුන් පිදීම	හගල යැදීම	මිල්ල කැපීම
B	කොහොඹා දෙවි	පත්තිනි	දෙවොල්
C	වැදි යක්කම	පොත් කඩේ පාලිය	රාම මැරීම

25. කොහොඹාකංකාරිය ශාන්ති කර්මයට ආවේනික චාරිත්‍ර විධි ඇතුළත් වන්නේ,
(1) A තීරුවේ 1 හා 2ය. (2) A තීරුවේ 1 හා 3ය.
(3) A තීරුවේ 2 හා 3ය. (4) C තීරුවේ 1 හා 3ය.

26. දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්ති කර්ම දෙකෙහිම පුද ලබන දෙවිවරු දැක්වෙන්නේ,
(1) B තීරුවේ 1 හා 2ය. (2) B තීරුවේ 1 හා 3ය.
(3) B තීරුවේ 2 හා 3ය. (4) C තීරුවේ 1 හා 3ය.

27. පහන් මඩුව ශාන්ති කර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාළි ඇතුළත් වන්නේ,
(1) A තීරුවේ 1 හා 2 ය. (2) C තීරුවේ 1 හා 2 ය.
(3) C තීරුවේ 1 හා 3 ය. (4) C තීරුවේ 2 හා 3 ය.

28. මෙම ඡායාරූපයේ දැක්වෙන්නේ,
(1) අඹවිදමන
(2) රාම මැරීම
(3) ගරා නැටීම
(4) ඇත් බන්ධනය



29. වෙම්බු, කෝලාට්ටම් යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් නම්,
(1) කළ හා කුලු වේ. (2) කල හා ලී කෙළි වේ.
(3) ලී කෙළි හා කුලු වේ. (4) ලී කෙළි හා කල වේ.

30. සිසි සහ චන්ද යන චරිත දැකිය හැකි මුද්‍රා නාට්‍යය වන්නේ,
(1) කුඹී කතාව (2) කරදිය (3) නල දමයන්ති (4) සිරිසඟබෝ

II කොටස

<u>උඩරට නර්තනය</u>

31. **"තකට තකට තක තරිකිට කුද කුද තා තක ජී ජී කුද"** යන කස්තිරම භාවිත වන්නේ,
(1) අටවන ගොඩ සරඹයේ ය. (2) නව වන ගොඩ සරඹයේ ය.
(3) දහවන ගොඩ සරඹයේ ය. (4) එකොළොස්වන ගොඩ සරඹයේ ය.

32. වෙස් ඇදුම් කට්ටලයේ ඉණට සහ පපු ප්‍රදේශයට පළඳින ආභරණ වන්නේ,
(1) ඉණ පටිය සහ හැට්ටය (2) පායිම්පත සහ අවුල් හැරය.
(3) ඉනපටිය සහ හඟල (4) බුබුළුපටිය සහ අවුල්හැරය

33. ආතත ගණයට අයත් භාණ්ඩයක් වන මෙහි බෙර කටෙහි විශ්කම්භය **විග්ගුස්සක්** වේ. මෙම වාද්‍ය භාණ්ඩය නම්,
(1) ගැට බෙරය යි. (2) දෙවොල් බෙරය යි. (3) දවුල් බෙරය යි. (4) තම්මැට්ටම යි.

34. සුළු මැදුම් (2+3) දෙතිතට අයත් අඩව්ව ඇතුළත් වරණය තෝරන්න.
(1) තත් තකට තකරොං ...., (2) තත් තොග තක තොග ...,
(3) ගත්ත තෙහිඟු තකට තකුද ...., (4) තත්ත තරි තරි තතරි තරි තරි ....,

35. "**වන පැත්ත බිය පත්ව සයනම් || - දුටත් යනෙන විටත් දුවන**" මෙම කවිය අයත් වන්නේ,
(1) සිංහරාජ වන්නමට ය. (2) හනුමා වන්නමට ය.
(3) මුෂලඩි වන්නමට ය. (4) තුරහා වන්නමට ය.

36. උඩරට නර්තනය සම්ප්‍රදායට අයත් ගායනය සහිත නර්තනාංග ලෙස සැලකෙන්නේ,
(1) ආවැන්දුම, දුනුමාලප්පුව හා යක් ඇදුම (2) අස්නෙ, මඩුපුරය හා කොහොඹාහැල්ල
(3) ආවැන්දුම, මඩුපුරය හා යක් ඇනුම (4) අස්නෙ, හත්පදය හා කොහොඹා හැල්ල

37. උඩරට නර්තනයේ දියුණුවට කටයුතු කළ ප්‍රවීණ කලාකරුවෙකි,
(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා (2) මහාචාර්ය තිස්ස කාරියවසම්මහතා
(3) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා (4) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

38. උඩරට වන්නමකට ව්‍යූහාත්මක කොටස් සංඛ්‍යාව,
(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) හයකි.

39. ගැටබෙරයට අයත් කොටස් ලෙස සැලකෙන්නේ,
(1) වලයම සහ සුරත්තට්ටුව (2) වෙනිවර සහ සුරත්තට්ටුව
(3) කැපුම් හම සහ අඩ බෑය (4) මණ්ඩම හා සුරත්තට්ටුව

40. **"තත් තොහ තක තොහ, තත්කඩ තරිකිට ....."** මෙය,
(1) තරහා වන්නමේ අඩව්වකි. (2) මුසලඩි වන්නමේ අඩව්වකි.
(3) හනුමා වන්නමේ අඩව්වකි. (4) සිංහරාජ වන්නමේ අඩව්වකි.

Past Papers Wiki

III කොටස

පහතරට නර්තනය

31. **"ගුහිති ගදිරිකිට ගුද ගුද ගුදිතගු දිත්තත් ..."** යන ඉරට්ටිය භාවිත ඉලංගම් සරඹය නම්,
(1) අට (2) නවය (3) දහය (4) එකොළහ

32. තෙල්මේ ඇදුම් කට්ටලයේ ඉනට සහ පපු ප්‍රදේශයට භාවිත කරන රංග වස්ත්‍රාභරණ වන්නේ,
(1) කර තැල්ල සහ පුන නූල යි. (2) තෙල් කච්චිය සහ දෙවල්ල යි.
(3) තෙල්කච්චිය සහ උල්උඩය යි. (4) තෙල් කච්චිය සහ තෙල්මෙ හැට්ටය යි.

33. ආතත ගණයට අයත් භාණ්ඩයක් වන මෙහි බෙර ඇස සඳහා බොකුහම් භාවිත වේ. මෙය,
(1) දෙවොල් බෙරය යි. (2) ගැට බෙරය යි. (3) තම්මැට්ටම යි. (4) දවුල යි.

34. සුළු මහ දෙතිත (2+4) අයත් ඉරට්ටිය වන්නේ,
(1) දොම් තත් දිම් ගත ගුගුදිත ...., (2) ගුද ගත ගත ගුද ...,
(3) දිං ගදිත තං දොංත ..., (4) තක දිත් තක දොම් ...,

35. **"සිරිපිරි ගිරි මුදුනත සුර - පුර ලෙසිනා"** මෙම කවිය අයත් වනුයේ,
(1) නාතිලිංචි තාලයට යි. (2) අනුරාගදණ්ඩ තාලයට යි.
(3) ශුද්ධ තාලයට යි. (4) ඊශ්වරකුණ්ඩ තාලයට යි.

36. පහතරට නර්තනය සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) තෙල්මෙ, ආවැන්දුම, ශුද්ධතාලය (2) තෙල්මෙ, දෙවොල් හා ශුද්ධ මාත්‍රා
(3) නානුමුරය, අස්නෙ, ශුද්ධතාලය (4) දෙවොල්, අස්නෙ, ශුද්ධ මාත්‍රා

37. පහතරට නර්තනයේ දියුණුවට කටයුතු කළ ප්‍රවීණ කලාකරුවෙකි,
(1) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා (2) මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා
(3) මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න මහතා (4) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

38. පහතරට සින්දු වන්නමක ව්‍යූහාත්මකව කොටස් සංඛ්‍යාව,
(1) හතකි. (2) හයකි. (3) පහකි. (4) හතරකි.

39. පහත රට බෙරයට අයත් කොටස් දෙකකි,
(1) වෙනිවර සහ සුරත්තට්ටුවයි. (2) හයි තට්ටුව සහ සූරල් තට්ටුව
(3) කැපුම් හම සහ බෙර පුහුල (4) හයි තට්ටුව සහ සුරත්තට්ටුව

40. **"තත් ගුද ගත දිත් දිත් තෙයි"** මෙය,
(1) අනුරාගදණ්ඩ තාලයේ ඉරට්ටියයි. (2) ලලිතරාග තාලයේ ඉරට්ටියයි.
(3) ශුද්ධ තාලයේ ඉරට්ටියයි. (4) නාතිලිංචි තාලයේ ඉරට්ටියයි.

Past Papers Wiki

IV කොටස

සබරගමු නර්තනය

31. **"තරිකිට දිරිකිට දිරිකිට තරිකිට"** යන්න කීවෙනි දොඹින පදය ද?
(1) නව වැනි (2) දහ වැනි (3) එකොළොස්වැනි (4) දොළොස්වැනි

32. පබළු ඇඳුම් කට්ටලයේ හිසට සහ පපු ප්‍රදේශයට භාවිත කරන රංග වස්ත්‍රාභරණ වන්නේ,
(1) නෙත්තිමාලය සහඅවුල්හරයයි. (2) නෙත්තිමාලය සහ පබළු හැට්ටයයි.
(3) හිස් පළඳනාව සහ අවුල්හැරයයි. (4) හිස් පළඳනාව සහ පබළු හැට්ටයයි.

33. විනාතත ගණයට අයත් භාණ්ඩයක් වන මෙහි කද දිග පසළොස් අඟුලකි. මෙය,
(1) දවුල යි. (2) තම්මැට්ටම යි. (3) ගැටබෙරය යි. (4) දෙවොල් බෙරය යි.

34. සුළු මැදුම් (2+3) දෙතිතට අයත් අඩව්ව කුමක් ද?
(1) තත් තරිඟු තත් තකට (2) ජීං කිටිතත් තත් කිටි තක
(3) තා තත්ජිත් තකට තත්ජිත් (4) තහර්ද තත් ජිත්

35. **"රුව සමනා - උවත් මනා - ඉසි වඩනා රිටු නොමිනා"** මෙම කවිය අයත් වනුයේ,
(1) මණ්ඩුක වන්නමට ය. (2) විරාඩි වන්නමට ය.
(3) කොවුලා වන්නමට ය. (4) ආනන්ද වන්නමට ය.

36. සබරගමු නර්තනය සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) තෙල්මෙ, වඩිගපටුන හා පට්ටුතාල් මාත්‍රය
(2) මුදුන් තාලය, යහන් දැක්ම හා දේවකෝල්පාඩුව
(3) තෙල්මෙ, නේරංගම හා පට්ටුතාල් මාත්‍රය
(4) මුදුන් තාලය, යහන් දැක්ම හා කෝල්පාඩුව

37. සබරගමු නර්තනයේ දියුණුවට කටයුතු කළ ප්‍රවීණ කලාකරුවෙකි,
(1) ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය (2) ආචාර්ය වජීරා චිත්‍රසේන මහතා
(3) ආචාර්ය මිරැන්ඩා හේමලතා මහතා (4) ආචාර්ය වෛද්‍යාවති රාජපක්ෂ මහත්මිය

38. සබරගමු වන්නමක ව්‍යූහාත්මකව කොටස් සංඛ්‍යාව,
(1) හතකි. (2) හයකි. (3) හතරකි. (4) පහකි.

39. දවුලේ කොටස් දෙකක් වනුයේ,
(1) මණ්ඩම සහ තට්ටුව ය. (2) ගැටිය සහ තට්ටුව ය.
(3) ගැටිය සහ සුරත් තට්ටුව (4) ගැටිය සහ කැපුම් හම ය.

40. **"ජීංත ගත් තත් ගතිත ගත දොම්"** මෙය,
(1) විරාඩි වන්නමේ අඩව්වකි. (2) කොවුලා වන්නමේ අඩව්වකි.
(3) මණ්ඩුක වන්නමේ අඩව්වකි. (4) අනිලා වන්නමේ අඩව්වකි.

PAST PAPERS WIKI

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	නර්තනය (දේශීය) - II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස්:

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමිවේ.**

---

1) i. ගද්‍ය හා පද්‍ය කොටස් දෙකකින් සමන්විත ..... සී පද ජන ගායනා විශේෂයකි.

ii. බෞද්ධාගමික සිද්ධස්ථානවල සිදු කෙරෙන දවුල්, තම්මැට්ටම්, හොරණෑ වාදනය .....
වාදනය නමින් හඳුන්වයි.

iii. අයිලය යනු ..... ශාන්තිකර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

iv. එදා හෙළදිව කෘතිය රචනා කරන ලද්දේ ..... විසිනි.

v. ද්‍රවිඩ තරුණියන් ලී දෑතට ගෙන රෙදි පටිවලින් රටා වියමින් ..... කෝලාට්ටම් නටනු ලැබේ.

vi. රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී ..... වාදනය කරන ලදී.

vii. මිනික්කු සහ පච්චා යනු ..... නර්තනයේ වේෂ නිරූපණ ක්‍රම දෙකකි.

viii. වාර්ශිකව ඇසළ පෙරහැර මංගල්‍යය අවසාන වාරිත්‍රය ලෙස ..... සිදු කරනු ලබයි.

ix. පහත සඳහන් නර්තනාංග ඇතුළත් නර්තන සම්ප්‍රදායන් මොනවා ද?

(අ) අලාරිප්පු: (ආ) තෝඩයම්:

x. කරදිය මුද්‍රා නාට්‍යයේ රංග රචනය හා රංග වස්ත්‍ර නිර්මාණයට දායක වූ කලාකරුවන් දක්වන්න.

(අ) රංග රචනය: (ආ) රංග වස්ත්‍ර:

2) i. සිංහරාජ වන්නම හෝ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම හෝ විරාඩි වන්නමට හෝ අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

ii. "සොඹමන් දෙවිවරු සදෙනෙක් එතනට
බසිමින් චාමර ගත්තේ සුරතට "

මෙම කවි පාදය මාත්‍රා 4 + 4 තාලරූපයට අවග්‍රහයෙන් ප්‍රස්තාර කරන්න.

iii. සැවුලා වන්නමේ කස්තිරම / නාතිලිංචි තාලය සිංදු වන්නමේ ඉරට්ටිය / මණ්ඩුක වන්නමේ කලාසම ප්‍රස්තාර කරන්න.

PAST PAPERS WIKI

Past Papers Wiki

3) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. කුඹී කතාව ii. වන්නම් iii. සතරබීජාක්ෂර

iv. ආහාර්ය අභිනය v. සරඹ අභ්‍යාස

4) ශාන්තිකර්මවල චාරිත්‍ර චාරිත්‍ර, නර්තන, ගායන, වාදන, සැරසිලි තුලනාත්මකව සමාන අසමානතා ප්‍රදර්ශනය කරයි.

i. කොහොඹා කංකාරියේ දැකිය හැකි චාරිත්‍ර විධි හතරක් ලියන්න.

ii. පහතරට දෙවොල්මඩුව ශාන්ති කර්මයේ ඇතුළත් දෙවොල් හා පත්තිනි නර්තන අංග පිළිබඳ ඇගයීමක් කරන්න.

iii. සබරගමු පහන්මඩු යාගයේ සැරසිලි අංගයන් දෙකක් පිළිබඳ විස්තර කරන්න.

5) දේශීය ජන නාටක අතර ඉපැරණිතම ජන නාටකය සොකරි යැයි පැවසේ.

i. සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් හා පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න.

ii. සොකරි නාටකයට අයත් කවියක් ලියන්න.

iii. සොකරි ජන නාටකයේ වෙදරාළ හා පරයාගේ චරිත විස්තර කරන්න.

6)



A



B



C

i. A හා B රූප සටහනෙහි දැක්වෙන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කර ප්‍රචලිත ප්‍රදේශය බැගින් ලියන්න.

ii. C රූපසටහනට අයත් නර්තන සම්ප්‍රදායේ නර්තන අංගයක් විස්තර කරන්න.

iii. B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ ආගමික පසුබිම විස්තර කරන්න.

7) මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමට නර්තනය ඉවහල් වේ.

i. ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේදී රසවින්දනය වර්ධනය වන ආකාරය ලියා දක්වන්න.

ii. ඉවසීම ප්‍රගුණ කිරීමෙහිලා නර්තනය මගින් ලැබෙන පිටිවහල උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

iii. නිරෝගී ශරීරයක් පවත්වාගෙන යාමට නර්තනයේ ලැබෙන පිටිවහල අගයන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library